| සංජීව පෙරේරා මයා | - | රියදුරු |

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ මුල්‍ය තත්වය වැඩි දියුණු වී ඇත. කාර්යංශය විසින් ආදායම් පෙන්වීම සඳහා තම ක්‍රියාකාරකම් වලට පසුගිය වසර තුල ශක්තිය නොයොදන ලදි. කාරයාංශයෙහි පර්යේෂණ සහ ජාත්‍යන්තර අංශය ශක්තිමත් කරන ලදි. ඒ අනුව කාර්යංශය ආදායම් තත්වය නංවාලිම සඳහා පර්යේෂණ අංශය 2014 වසර සඳහා ශක්තිමත්ව ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි..

විදේශිය ප්‍රවර්ධන කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය සමග සම්පව කටයුතු කරන ලදි. එහි ප්‍රතිඵල රට තුලට ගෙන ඒමට කාර්යංශය කටයුතු කරනු ලබයි.

අනාගතයේදී සංචාරක පනතේ සිදුවන වෙනස් වීම් සමග කාර්යය ශ්‍රිතයන් ක්‍රියාකාරකම් අනාගත සැලසුම් කාර්යය ඵල ක්‍රියාකාරකම් සංචාරක ප්‍රවර්ධන කාර්යයන් වෙනස් වීමට භාජනය වනු ඇත.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
2013 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

## පටුන


| | පිටු අංක |
|---|---|
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 1 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය | 2 |
| ස්කන්ධය හා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශණය | 3 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 4 |
| ගිණුම් වලට අදාල සටහන් | 5-10. |

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
## 2013 දෙසැම්බර් දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා

| | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ බැංකු ශේෂයන් | 8 | 85,247,538.48 | 53,692,223.76 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 9 | 61,055,144.24 | 20,837,297.16 |
| පූර්ව ගෙවීම් | 10 | 1,175,509.08 | 5,301,904.00 |
| තැන්පතු | 11 | 80,000.00 | 80,000.00 |
| රඳවා ගැනීමේ බදු / වැට් බදු ලැබිය යුතු | | 450,553.57 | 450,553.57 |
| **මුළු ජංගම වත්කම්** | | 148,008,745.37 | 80,361,978.49 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 12 | 13,571,101.19 | 10,281,255.65 |
| අඩුකලා - ක්ෂය වෙන්කිරීම් | | 10,112,890.91 | 8,585,049.53 |
| ලියාපැදිම් වල වටිනාකම | | 3,458,210.28 | 1,696,206.12 |
| එකතු කලා - නොනිම් වැඩ | | | |
| දිගු කාලීන ආයෝජන | | - | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 3,458,210.28 | 1,696,206.12 |
| **මුළු වත්කම්** | | 151,466,955.65 | 82,058,184.61 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියන් | 13 | 1,122,483.16 | 58,949.34 |
| උපචිත වියදම් | 14 | 1,196,746.93 | 1,070,155.56 |
| විශ්‍රාම යාම් පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | | 1,087,639.00 | 954,007.00 |
| **මුළු ජංගම වගකීම්** | | 3,406,869.09 | 2,083,111.90 |
| **ශුද්ධ වත්කම්** | | 148,060,086.56 | 79,975,072.71 |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | |
| ආරම්භක ශේෂ හිමිකම් | | 6,433,492.69 | 6,433,492.69 |
| රඳවා ගත් ආදායම් | 15 | 80,815,169.23 | 35,849,429.70 |
| වසර සඳහා ලාභය | | 60,811,424.64 | 37,692,150.32 |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | 148,060,086.56 | 79,975,072.71 |

| | |
|---|---|
| නිල් රුවසිංහ | විපුල වනිගසේකර |
| සභාපති | සාමාන්‍යාධිකාරී |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය |

# ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය
## මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා

| | සටහන | 2013<br>රු | 2012<br>රු |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අපගමන බදු | | 64,195,481.95 | 60,878,416.91 |
| සංචාරක සංවර්ධන බදු | | 40,602,155.57 | 25,883,991.03 |
| වෙනත් ආදායම් | 16 | 3,916,875.82 | 2,863,863.19 |
| **මුළු ආදායම්** | | **108,714,513.34** | **89,626,271.13** |
| **වියදම්** | | | |
| වැටුප් වෙතන සහ සේවක ප්‍රතිලාභ | 17 | 8,980,803.65 | 6,334,958.35 |
| සැපයුම් සහ පාරිභෝගික භාවිතයන් | 18 | 3,426,177.69 | 2,985,692.09 |
| අලෙවිකරණ සම්බන්ධ වියදම් | 19 | 31,688,589.85 | 37,227,379.79 |
| පර්යේෂණ සහ සංවර්ධන | 20 | 1,835,570.99 | 3,251,075.36 |
| ක්ෂය සහ ක්ෂය කිරීමේ වියදම් | | 1,527,841.38 | 1,483,270.42 |
| වෙනත් වියදම් | 21 | 424,600.00 | 644,600.00 |
| මූල්‍ය වියදම් | 22 | 19,505.14 | 7,144.80 |
| **මුළු වියදම්** | | **47,903,088.70** | **51,934,120.81** |
| **කාල පරිච්ඡේදයට අදාල අතිරික්ත / ඌනතා** | | **60,811,424.64** | **37,692,150.32** |

**සටහන** 15

**ශ්‍රී ලංකා සමුර්ධි කාර්යාංශය**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| **විස්තරය** | ප්‍රාග්ධන සංචිත | රඳවා ගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,433,492.69 | 35,849,429.70 | |
| වසර සඳහා ලාභය 2012 | | 37,692,150.32 | |
| පෙර වසරේ ගැලපීම් | | 333,044.01 | |
| 2013 වසර සඳහා ලාභය | | 67,751,969.84 | |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **6,433,492.69** | **141,626,593.87** | **148,060,086.56** |

**ශ්‍රී ලංකා සමුමුති කාර්යංශය**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා**

| | 2013 |
|---|---|
| | රු. |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ අතිරික්තය / ඌනතාවය (බදු ගෙවීමට පෙර සහ විශේෂ අයිතමයන්) | 60,811,424.64 |
| මූල්‍ය නොවන චලනයන් | |
| ක්ෂයවීම් | 1,527,841.38 |
| සේවක ණය තැන්පතු පොලී | (23,275.82) |
| පෙර වසරේ ගැලපීම් | 6,940,545.20 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 133,632.00 |
| වැටුප් සඳහා වෙන් කිරීම් | 333,044.01 |
| වැඩිවීම් / අඩුවීම් අයවිය යුතු | (40,217,847.08) |
| වැඩිවීම් / අඩුවීම් පූර්ව ගෙවීම් | 4,126,394.92 |
| වැඩිවීම් / අඩුවීම් උපචිත වියදම් | 126,591.34 |
| වැඩිවීම් / අඩුවීම් ණයහිමියන් | 1,063,533.82 |
| සේවක ණය තැන්පතු පොලී | 23,275.82 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ප්‍රමාණය** | **34,845,160.23** |
| **ආයොජන ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රවාහය** | |
| දේපල යන්ත්‍ර උපකරණ මිලදී ගැනිම | (3,289,845.54) |
| **ශුද්ධ මුදල් යෙදවුම් ආයෝජන ක්‍රියාකාරකම්** | **(3,289,845.54)** |
| **මූල්‍ය කිග්‍රාකාරකම්හි මූල්‍ය ප්‍රවාහය** | |
| ශුද්ධ වැඩිවීම් / අඩුවීම් මුදල් සහ මුදල් සමාන ඉපැයුම් වල ශුද්ධ වටිනාකම | 31,555,314.72 |
| කාල පර්ච්ඡේදය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන ඉපැයුම් | 53,692,223.76 |
| කාල පර්ච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන ඉපැයුම් | **85,247,538.48** |

**ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය**
**ගිණුම්මය සටහන්**
**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

1. **සාමාන්‍ය තොරතුරු**

**ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය**

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය 2005 අංක 38 දරණ සංචාරක පනත යටතේ ස්ථාපිත කර ලියාපදිංචි කර ඇත. ප්‍රධාන කාර්යාලය, අංක 78, කොළඹ 03 දරණ ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ 04 වන මහලේ පිහිටා ඇත. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් සම්මේලන, ඒකාබද්ධ රැස්වීම්, සංචාරකයින් ගෙන්වා ගැනීමේ දිරි ගැන්වීම් සහ ප්‍රදර්ශන ප්‍රවර්ධන කටයුතු සිදු කරනු ලබයි.

2. **ගිණුම්මය ප්‍රතිපත්තින් සහ සකස් කිරීමේ පදනම**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය යන මූල්‍ය ප්‍රකාශනයන් ගිණුම්මය ප්‍රතිපත්තින් මත සකස් කර ඇත. එම ගිණුම් ප්‍රතිපත්තින් සහ ගිණුම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්තින් වලට අනුකූල වේ ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සම්මත ගිණුම් සම්ප්‍රදායන්ට අනුව ඓතිහාසික පදනම මත ගිණුම් පිළියෙල කර ඇත.

3. **දේපල, යන්ත්‍රසූත්‍ර, උපකරණ**

සියළු දේපල පිරියත, යන්ත්‍ර උපකරණ ඓතිහාසික පිරිවැය මත ගණනය කර ඇත. එනම් ගැනුම් පිරිවැය සහ ඉදිකිරීම් පිරිවැය මත වේ. ක්ෂය වීම් පිරිවැය අදාල කාල පරිච්ඡේදයට අනුව පෙන්වා දී ඇති අතර ක්ෂය ගණනය පහත දක්වා ඇත.

| **වත්කම්** | **අනුපාතය** |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| මෝටර් රථවාහන | 25% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| ගොඩනැගිලි | 5% |

4. **වගකීම් සහ වෙන්කිරීම්**

ශේෂපත්‍රයේ දිනට අදාල ප්‍රමානාත්මක වගකීම් ගිණුම් වල ඇතුලත් කර ඇත.

5. **විශ්‍රාමික ප්‍රතිලාභ**

1983 අංක 12 දරණ පාර්තෝගික ගෙවීම් පනත යටතේ විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම සඳහා විධි විධාන සකස් කර ඇත. අවසන් ප්‍රතිලාභ සකස් කර ඇත්තේ වර්තමාන වැටුප් තලයේ මාසික වැටුපෙන් භාගයක් වන පරිදි වේ.

6. **පෙර වසර සඳහා ගැලපුම්**

2013 වර්ෂයේ පූර්ව වර්ෂයට අදාල ගැලපුම් මූල්‍ය ලෙස ගිණුම් වලට ගෙන ඇත්තේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාර්යෙන් ලැබිය යුතු අපගමන බදු සහ සංචාරක සංවර්ධන බදු සඳහා වෙන් කිරීම් වේ.

8 මුදල් සහ අතැති මුදල් / බැංකු ශේෂයන්

| අයිතම | 2013 (රු) | 2012 ( රු) |
|---|---|---|
| බැංකු ශේෂයන් - ලංකා බැංකුව | 74,349,595.28 | 46,843,880.56 |
| බැංකු ශේෂයන් - මහජන බැංකුව | 10,877,943.20 | 6,828,343.20 |
| සුළු මුදල් | 20,000.00 | 20,000.00 |
| **මුදල් සහ අතැති මුදල් / බැංකු ශේෂයන් එකතුව** | **85,247,538.48** | **53,692,223.76** |

9 වෙළඳ සහ අනෙකුත් ලැබීම්

| අයිතම | 2013 (රු.) | 2012 ( රු.) |
|---|---|---|
| සේවක ණය | 458,098.20 | 636,013.83 |
| උත්සව අත්තිකාරම් | 2,000.00 | 1,000.00 |
| සේවක අයවිය යුතු මුදල් | 31,755.25 | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 58,115,406.91 | 20,170,673.33 |
| ඒට්කන් ස්පෙන්ස් හෝටල් කළමනාකරණය | 20,000.00 | - |
| ලංකා ස්පෝර්ට්රයිසන් | 20,000.00 | |
| ශ්‍රී ලංකන් ගුවන් සේවය | 2,387,843.88 | |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | - | 450.00 |
| සංචාරක අමාත්‍යංශ | - | 29,120.00 |
| සන්වේ හොලිඩේස් | 1,800.00 | 1,800.00 |
| ටැන්ජරින් හෝටලය | 18,240.00 | (1,760.00) |
| **එකතුව** | **61,055,144.24** | **20,837,297.16** |

10 පූර්ව ගෙවීම්

| අයිතම | 2013 ( රු.) | 2012 ( රු) |
|---|---|---|
| අලෙවිකරණ සඳහා ගෙවීම් | 101,018.37 | 4,700,644.63 |
| රක්ෂණ | 954,773.81 | 110,449.26 |
| කාර්යාලීය උපකරණ අළුත්වැඩියාව | 119,716.90 | 490,810.11 |
| | | |
| **එකතුව** | **1,175,509.08** | **5,301,904.00** |

11 තැන්පතු

| අයිතම | 2013 (රු) | 2012 ( රු.) |
|---|---|---|
| ශ්‍රීලංකා ටෙලිකොම් | 5,000.00 | 5,000.00 |
| C.F. ද මෙල් සහ පුත්‍රයෝ | 75,000.00 | 75,000.00 |
| **එකතුව** | **80,000.00** | **80,000.00** |

12 දේපල, පිරියත සහ උපකරණ

සටහන් අංක . 2A

| සටහන | සංකේත අංකය | විස්තරය | 2013.01.01 දිනට ශේෂය | එකතුකිරීම් 2013 | මාරුකිරීම් 2013 | 2013.12.31 දිනට ශේෂය | එකතුනල ක්ෂය අගය 2013.01.01 | 2013.12.31 දිනට ක්ෂය | එකතුකල ක්ෂය අගය 2013.12.31 | ශුද්ධ පොත් වටිනාකම 2013.12.31 දිනට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.1 | 101 | කාර්යාලීය උපකරණය | 5,456,970.29 | 666,803.00 | | 6,123,773.29 | 5,437,448.01 | 552,327.03 | 5,989,775.04 | 133,998.25 |
| 3.2 | 102 | ගොඩනැගිලි | | 2,020,565.00 | | 2,020,565.00 | - | 16,838.00 | 16,838.00 | 2,003,727.00 |
| 3.3 | 103 | ලී බඩු සහ සවිකිරීම් | 945,785.36 | 602,477.54 | | 1,548,262.90 | 794,945.27 | 97,051.35 | 891,996.62 | 656,266.28 |
| 3.4 | 110 | මෝටර් රථ වාහන | 3,158,500.00 | - | | 3,158,500.00 | 1,776,656.25 | 789,625.00 | 2,566,281.25 | 592,218.75 |
| 3.5 | 111 | මෘදුකාංග | 720,000.00 | - | | 720,000.00 | 576,000.00 | 72,000.00 | 648,000.00 | 72,000.00 |
| | | උප එකතුව | **10,281,255.65** | **3,289,845.54** | | **13,571,101.19** | **8,585,049.53** | 1,527,841.38 | **10,112,890.91** | **3,458,210.28** |

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2013.12.31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා

13 **ණයහිමියන්**

| **අයිතම** | **2013 ( රු)** | **2012 ( රු.)** |
|---|---|---|
| බෙන්තොට බීච් | 51,676.00 | - |
| ලංකා ස්පෝර්ට්රයිසන් | 250,000.00 | - |
| GPR සංනිවේදනය | 378,854.11 | - |
| මොබටෙල් පුද්. සමාගම | 18,058.80 | 12,535.24 |
| ඇමරිකන් ප්‍රිමියම් වෝටර් | - | 1,214.63 |
| දකුණු කොළඹ සහයෝගිතා සමාජය | - | 11,948.00 |
| සැලසිනේ | 246,758.40 | - |
| ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක සංගමව | 3,475.00 | 7,375.00 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 22,258.19 | 21,313.59 |
| රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව | 129,500.00 | - |
| ඩයලොග් බ්‍රොඩ්බෑන්ඩ් නෙට් වර්ක් | 4,234.66 | 4,562.88 |
| C.F ද මෙල් සහ පුත්‍රයෝ | 17,668.00 | - |
| **එකතුව** | **1,122,483.16** | **58,949.34** |

14 **උපචිත වියදම්**

| **අයිතම** | **2013 ( රු)** | **2012 ( රු.)** |
|---|---|---|
| අනෙකුත් ගෙවිය යුතු | 402,850.00 | 333,044.01 |
| ගෙවිය යුතු බදු | - | 16,975.00 |
| ගෙවිය යුතු සේවක අර්ථ සාධක | - | 150,336.49 |
| ගෙවිය යුතු භාරකාර අරමුදල | - | 11,162.13 |
| ආදායක ගෙවිය යුතු | (571.00) | 2,289.00 |
| ෆීනික්ස් ඔගිල්වි | 1,785.93 | 1,785.93 |
| ශ්‍රීලංක ාසංචාරක සංවර්ධන අධිකාරිය | 611,162.00 | 144,563.00 |
| රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව | 181,520.00 | 410,000.00 |
| **එකතුව** | **1,196,746.93** | **1,070,155.56** |

15 **වෙනත් ආදායම්**

| **අයිතම** | **2013 ( රු)** | **2012 ( රු.)** |
|---|---|---|
| පොලී ආදායම - සේවක ණය | 23,275.82 | 31,863.19 |
| සහභාගිවීමේ ගාස්තු | 3,893,600.00 | 2,832,000.00 |
| | **3,916,875.82** | **2,863,863.19** |

16 **වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ**

| | 2013 (රු) | 2012 ( රු) |
|---|---|---|
| වැටුප් සහ අනෙකුත් දීමනා | 4,679,798.95 | 3,653,459.60 |
| නිවාඩු සහ වෙනත් දීමනා | 317,623.00 | 451,477.00 |
| සභාපතිතුමාගේ දීමනා | 720,000.00 | 667,081.25 |
| සභාපතිතුමාගේ ඉන්ධන සහ වාහන කුලියට ගැනිම | 618,415.50 | 532,081.25 |
| සේවක අතිකාල | 156,792.65 | 155,935.99 |
| සේවක අර්ථසාධක | 400,699.51 | 518,798.77 |
| සේවක භාරකාර අරමුදල | 93,179.28 | 89,664.40 |
| සේවක සුභසාධන | 209,789.36 | 253,235.13 |
| සේවක සුභසාධක - ශ්‍රී ලංකා සංවරණය. | 209,000.00 | - |
| සේවක නිල ඇදුම් | 128,030.90 | 22,382.35 |
| ගමන්ගාස්තු දේශිය | 1,039,555.00 | 561,949.00 |
| පාරිතෝශිත | 133,632.00 | 149,582.00 |
| පැමිනීමේ දිරි දීමනා | 274,287.50 | 196,867.00 |
| **එකතුව** | **8,980,803.65** | **7,080,432.49** |

17 **සැපයුම් සහ පාරිභෝගික භාවිතයන්**

| **අයිතම** | 2013 ( රු) | 2012 ( රු) |
|---|---|---|
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 264,913.45 | 742,701.03 |
| දුරකථන | 572,628.71 | 531,413.37 |
| මුද්දර ගාස්තු සහ පණිවුඩ සේවා ගාස්තු | 33,054.24 | 46,986.46 |
| කාර්යාල අවශ්‍යතා | 103,641.91 | 83,663.73 |
| රක්ෂණ | 793,513.23 | 354,433.49 |
| නඩත්තු - කාර්යාල | 693,190.84 | 82,918.92 |
| ඉන්ධන දීමනා | 641,562.50 | 398,315.04 |
| නඩත්තු සහ වාහන අළුත්වැඩියා | 202,849.71 | 212,655.56 |
| විවිධ වියදම් | 28,734.15 | 8,064.15 |
| වැටු බදු | 92,088.95 | 164,540.34 |
| **එකතුව** | **3,426,177.69** | **2,625,692.09** |

18 **අලෙවිකරණ වියදම්**

| **අයිතම** | 2013 ( රු) | 2012 ( රු) |
|---|---|---|
| විදේශ ප්‍රවර්ධන / ප්‍රදර්ශන | 21,344,244.88 | 15,110,694.25 |
| මුදණ සහ නිෂ්පාදන | 1,715,890.31 | 362,280.45 |
| ප්‍රචාරණය | 232,784.00 | 248,741.14 |
| ඉන්දියානු ප්‍රවර්ධනය | - | 76,500.00 |
| අලෙවිකරණ වියදම් - අනෙකුත් | 277,944.76 | 388,868.59 |
| ක්‍රියාකාරකම් සඳහා සහාය | 6,693,044.59 | 21,040,295.36 |
| ෆැම් ටුවර්ස් | 1,414,681.31 | - |
| ඉදිරිපත්කිරීම දේශිය | 10,000.00 | - |
| **එකතුව** | **31,688,589.85** | **37,227,379.79** |

20 **පර්යේෂණ සහ සංවර්ධනය**

| **අයිතම** | **2013 ( රු)** | **2012 ( රු)** |
|---|---|---|
| ICCA සාමාජිකත්වය | 496,530.72 | 445,787.59 |
| පරිගණක දත්ත ගබඩා නඩත්තු | 31,474.30 | 15,000.00 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යංශ පුහුණු වැඩසටහන් | 890,687.28 | 2,057,541.63 |
| සමමේලන මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා | 416,878.69 | 732,746.14 |
| **එකතුව** | **1,835,570.99** | **3,251,075.36** |

21 **වෙනත් වියදම්**

| **අයිතම** | **2013 ( රු)** | **2012 ( රු)** |
|---|---|---|
| මාණ්ඩලික අධ්‍යක්ෂ දීමනා | 294,600.00 | 234,600.00 |
| වෘත්තිය ගාස්තු | 130,000.00 | 410,000.00 |
| **එකතුව** | **424,600.00** | **644,600.00** |

22 **මූල්‍ය පිරිවැය**

| **අයිතම** | **2013 ( රු.)** | **2012 (රු)** |
|---|---|---|
| බැංකු ගාස්තු | 19,505.14 | 7,144.80 |
| **එකතුව** | **19,505.14** | **7,144.80** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. } TM2/K/SLCB/1/13/05 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. } | දිනය<br>திகதி<br>Date } 2014 සැප්තැම්බර් 04 දින |

සභාපති,
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2014 මැයි 23 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.අංක 09 ප්‍රකාරව තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

ගොඩනැගිලි පරිශ්‍රයේ අළුත්වැඩියාව වෙනුවෙන් දරන ලද රු. 2,020,565 ක වියදම ස්ථාවර වත්කම් ලෙස පෙන්වා තිබුණි.

### 2.2.3 අසම්භාව්‍ය බැරකම්

-----------------------

2008 වර්ෂයේ සිට ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයට අයත් ගොඩනැගිල්ලේ කාර්යාංශය කුලී ගිවිසුමකින් තොරව පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කුලී ගෙවීම සිදුකර නොතිබුණි. ගොඩනැගිලි කුළිය තක්සේරු කර දන්වන ලෙස අදාල ආයතනයෙන් ඉල්ලා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් කුළිය තක්සේරු කර දන්වා නොතිබුණි. කෙසේ වුවද මේ දක්වා ගිණුම්වල වෙන්කිරීම් කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

----------------------------------

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ ගිණුම් හා අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සංසන්දනය කිරීමේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | ගිණුම අනුව ශේෂය | සංසන්දනය කල ආයතනය | එම ගිණුමේ ශේෂය | වෙනස වැඩිවීම/(අඩුවීම) |
|---|---|---|---|---|
| | (රු.) | | (රු.) | (රු.) |
| ණය හිමියෝ | නැත | ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනය | 53,559 | ( 53,559) |
| උපචිත වියදම් | 611,162 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 694,466 | ( 83,304) |

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආපසු අය කරගතයුතු එකතු කල අගය මත බදු රු.450,554 ක් 2011 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර තිබු නමුත්, අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | (රු.) | |
| ණය ගැතියෝ | 2,446,084 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| ණය හිමියෝ | 1,122,483 | -එම- |
| උපචිත වියදම් | 1,196,747 | -එම- |

**නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ආයතන සංග්‍රහය VI පරිච්ඡේදය 2.10 වගන්තිය. | බඳවාගැනීම්,ස්ථානමාරුවීම්,උසස්වීම්,වැටුප් වර්ධක ගෙවීම් හා සේවක විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වන ලිපිවල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ආ)2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛය 4 පරිච්ඡේදයේ 2.1 (අ) ඡේදය | ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක සැලසුමක් සහිතව අවම වශයෙන් වර්ෂ තුනක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කලයුතු වුවද කාර්යාංශය එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි. |
| (ඇ)2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 1A1/2002/2 | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.60,811,424 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.37,692,150 ක අතිරික්තයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,119,274 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. අපගමන බදු ආදායම හා සංචාරක සංවර්ධන බදු ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීමට මූලික හේතුව වී තිබුණි.

.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

සමාලෝචිත වර්ෂයේ දී කාර්යාංශයේ ආදායම රු.108,714,513 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.89,626,271 සමඟ සැසඳීමේදී සියයට 21.2 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ දී කාර්යාංශය වැය කර තිබුණු රු.67,922,071 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී රු.40,962,543 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 39.7 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

4 මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්යසාධනය

---

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 42(2) වගන්තිය අනුව පහත සඳහන් අරමුණු හා පරමාර්ථ කාර්යාංශයට සමාලෝචිත වර්ෂයේදී හෝ පෙර වර්ෂ වලදී හෝ ඉටුකරගැනීමට නොහැකිව තිබුණි.

(අ) ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් වශයෙන් හා පොළඹවන සුළු චාරිකා ගමනාන්තයන් වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම සඳහා සැලසුම් කළ පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම;

(ආ) සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සාර්ථකව පැවැත්වීම සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශීය සම්මේලන, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවිධායකයන් සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතාව පවත්වා ගැනීම;

(ඇ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන් වල විවිධ අංශවල නිරතව සිටින තැනැත්තන්ට සහ සංවිධානවල වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ එම ප්‍රමිති පවත්වාගැනීම බලාත්මක කිරීම;

(ඈ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා පිළිබඳ විවිධ අංශවල කටයුතු කිරීමෙහි නියැලී සිටින විවිධ ගණවල තැනැත්තන්ගේ හෝ සංවිධානවල වෘත්තීය නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටින යම් සංගම් හෝ සංවිධාන සමග අනුබද්ධවීම, ඒවායේ සමාජිකත්වය ලබා ගැනීම හෝ ඒ යම් සංගම් හෝ සංවිධාන සමඟ ගිවිසුම්වලට ඇතුලත් වීම;

(ඊ) ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාව සංචාරක හා වාරිකා ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොළෙහි අළෙවි කිරීම සඳහා කාර්යාංශයට මඟපෙන්වීම ලබාදීම;

(උ) සත්කාරක සේවා ඇතුළුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවා, අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ආකාරයට සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

කාර්යාංශ බැංකු ජංගම ගිණුමේ සෑම මාසයක් අවසානයේදීම රු. මිලියන 43 කට අධික මුදලක් ඉතිරි වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මත ජංගම අනුපාතය 43:1 ඉහල අනුපාතිකයක පවතින බවත් කාරක ප්‍රාග්ධන කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමකින් සිදු කෙරී නොමැති බවත් නිරීක්ෂණය විය.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

කාර්යාංශයේ රාජකාරීවලට අදාළ නොවන විදේශ ගමනක් සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව රු.517,450 ක් වැයකර තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 18 ක් පුරප්පාඩුව පැවති අතර ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සඳහා මුළු පිරිවැය පිළිවෙලින් රු.මිලියන 6.3 ක් සහ රු.මිලියන 8.9 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේ දී එක් සේවකයෙකු සඳහා වූ පිරිවැය පිළිවෙලින් රු.1,055,826 ක් සහ රු. 997,867 ක් විය.

4.5 සේවක පාරිතෝෂික වෙන් කිරීම

------------------------------------

සේවකයන් සඳහා පාරිතෝෂික ගෙවීමට වෙන්කරන ලද රු.1,087,639 ක මුදල සුදුසු ආයෝජනයක යෙදවීමට කටයුතුකර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

----------------------

2013-2015 කාලය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.88,800,000 ක මුදලක් වැයකිරීම අපේක්ෂා කර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වැය කිරීමට සැලසුම්කර තිබුණේ රු.63,950,000 ක් වීමෙන් සංයුක්ත සැලැස්මට අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සංයුක්ත සැලැස්මෙහි සමාලෝචිත වර්ෂය සඳහා වන සැලැස්මට අනුව වියදම් ශීර්ෂ තුනක් යටතේ වියදම දක්වා තිබුණි. එහි විස්තරාත්මකව වර්ෂය තුළ ළඟාකර ගැනීමට අපේක්ෂිත පරමාර්ථ හා ඉලක්කයන් දක්වා නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාර සංයුක්ත සැලැස්මෙන් ඉදිරිපත් කර තිබූ කාර්ය සාධන සැලැස්මෙහි අදාල කාලය සඳහා සැලසුම් කර තිබූ අරමුණු හා ඉලක්කයන් ලඟාකර ගැනීම සඳහා වගකිවයුතු නිළධාරීන් පැහැදිලිව සඳහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉදිරිපත් කර තිබූ අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් වර්ෂය තුළදී ලඟාකරගත්තේද යන්න තහවුරු කර ගැනීම සඳහා අදාළ භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

--------------------------

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ආවරණය කරනු ලැබුවත්, මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව කාර්යාංශයේ මෙහෙයුම්වලට අදාළව විගණන කාර්යයන් සිදුකර නොතිබුණි.

ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛයේ අංක 8 හි 4.2.1(බී) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් (විචලන පරාසය සියයට 22 ක් ඉක්ම වූ) සහිත වැය විෂයයන් 10 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බව දක්නට නොලැබුණි.

5.6 වාර්ෂික වාර්තාව සභාගත කිරීම

------------------------------------

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2011 වාර්ෂික වාර්තාව 2014 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව මුදල් පනතේ 13(7)ඒ වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලැබූ විස්තරාත්මක වාර්තාව මගින් කාර්යාංශයේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) අයවැය

(ආ) ගිණුම්කරණය.

(ඇ) ප්‍රවර්ධන කටයුතු මෙහෙයවීම.

(ඈ) මානව සම්පත් කළමනාකරණය.

(ඉ) අභ්‍යන්තර විගණන කාර්යයන්.

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.